**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2015**

-----------------------------------------------------------------------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 පිහිටුවීම

-------------

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5(ඉ) වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තියේ (1) උපවගන්තිය යටතේ 2014 ඔක්තෝබර් 1 දින සිට බලාත්මක වන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සකස්කරන ලද 2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය යටතේ එහි අනුබද්ධ ආයතනයක් ලෙස රත්මලාන

විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවා තිබුණි. වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6 හා 7 මට්ටමේ සහ ඒ සමාන මට්ටම්වල තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම ප්‍රධාන අරමුණ වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 4.1 වගන්තිය | මාසයක් කල් නොදී සිය තනතුරෙන් ඉල්ලා අස්වීමේදී මාසයක වැටුපක් ගෙවා එසේ කළ හැකි වුවද, උක්ත වගන්තියට පටහැනිව දේශකයින් ඉල්ලා අස්වීමේදී මාස 03ක වැටුප් අයකර ගෙන තිබුණි. එම වැටුප් අයකිරීමේදී සේවක අර්ථ සාධක හා භාරකාර අරමුදලට සේව්‍ය දායකත්වය ද ඇතුලත් කර ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඉල්ලා අස්වූ නිලධාරීන් තිදෙනකුගෙන් රු.25,538ක් මුදලක් වැඩිපුර අයකරගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 261(i) | සියළුම ගෙවීම් මුදල් පොතෙහි හා ඒ සඳහා නියමිත වෙනත් ගිණුම් පොත්වල යථා පරිදි සටහන් කළ යුතු අතර, මුදල් පොතේ සටහන් වලට අනුක්‍රමික අංක යොදා අදාල වවුචර වලටද එම අංක යෙදිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.311,511,641ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විගණනයේදී ප්‍රමාණවත් තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර ස්ථාවර වත්කම් හා ගබඩා ද්‍රව්‍ය සත්‍යාපනය කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ විද්‍යායතනය විසින් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතන වල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මගින් නිලධාරින් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වු වාර්තා තබාගත යුතු වුවත්, විද්‍යායතනය විසින් ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතයට ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2014 ඔක්තෝබර් මස 01 දිනැති වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියෙහි 15(1) ඡේදය | ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ගෙවනු ලබන සියලුම ගාස්තු, ආදායම් හා කවර හෝ මූලාශ්‍රයකින් උපයන වෙනත් මුදල් "විද්‍යායතන අරමුදල" නම් වූ අරමුදලකට බැර කළ යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ විද්‍යායතනය රැස්කළ ආදායම්වලින් රු.2,529,150 ක ආදායම් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ අතිරේක ලේකම් නමින් වූ ගිණුමකට බැර කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,151,297ක ඌනතාවයක් වී තිබුණද සේවක පිරිවැය සඳහා දරන ලද රු.14,753,436 අඩු කිරිමට පෙර ආයතනයේ දායකත්වය රු.13,602,139ක අතිරික්තයක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5,6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ හා සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, පාඨමාලා ආරම්භ කර වර්ෂයක් ඉකුත්ව තිබුණද, මෙම අරමුණු ඉටුකරගත හැකිවන ලෙස පාඨමාලා සංවර්ධනය කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ පවත්වනු ලැබූ පාඨමාලා 09ක් වෙනුවෙන් පවත්නා විද්‍යාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අධ්‍යයන උපකරණ ප්‍රමාණවත් නොවීම මත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සඳහා ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි.

(ii) විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලා පුහුණු පාඨමාලා ලෙස ප්‍රතීතනය කිරීමක් සිදු කළ යුතු වුවද ඒ සඳහා අවශ්‍ය තත්ත්ව පාලන පද්ධතිය විද්‍යායතනය තුළ ඇති කර ගැනීමට අවශ්‍ය විද්‍යාගාර පහසුකම්, අධ්‍යයන උපකරණ හා විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම සඳහා කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(iii) ඒ අනුව අපේක්ෂිත පරිදි ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක හා තත්ත්වයෙන් උසස් පාඨමාලා ශිෂ්‍යයන් වෙත ලබා දීමට මෙතෙක් විද්‍යායතනයට හැකියාව ලැබී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ රූපලාවන්‍ය තාක්ෂණ (Cosmetology Technology) පාඨමාලාව ආරම්භ කර නොතිබුණු අතර එම පාඨමාලාව හා දැනට පවත්වාගෙන යන පාඨමාලා 03ක් සඳහා අවශ්‍ය පහසුකම් සකස් කර නොතිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් මිලදී ගත් රු.47,054,869 ක විද්‍යාගාර උපකරණ පුහුණු කටයුතු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ විද්‍යායතනයේ පාඨමාලා 8ක් සඳහා බඳවා ගත් 133ක් වූ ශිෂ්‍යයන්ගෙන් 46ක් පාඨමාලා හැර ගොස් තිබුණි. එක් එක් පාඨමාලාව වෙන් වෙන්ව සැලකීමේදී පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 18 සිට සියයට 52 දක්වා වූ පරාසයක පැවතුණි. කෙසේ වුවද මෙම අනුපාතය අවම කර ගැනීම සඳහා ඊට හේතුවූ කරුණු හඳුනා ගෙන පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) **ඒක ශිෂ්‍ය පිරිවැය**

-------------------

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන් 101 දෙනෙකු වෙනුවෙන් දරන ලද පුනරාවර්තන වියදම රු.21,816,835ක් වූයෙන් වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.216,008ක් වී තිබුණි. විද්‍යායතනයේ බඳවාගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 270ක් ව පැවතියදී එසේ බඳවා නොගැනීම, ඒක ශිෂ්‍ය පිරිවැය වැඩිවීමට හේතුවී තිබූ බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් ගිවිසුම්වලට එළඹීමකින් තොරව විද්‍යායතනයේ පිරිසිදු කිරීම් හා ආරක්ෂක සේවා කටයුතු පෞද්ගලික ආයතනයකින් ඉටු කරවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ ඒ වෙනුවෙන් පිළිවෙලින් රු.715,665ක් හා රු.1,689,625ක් වැයකර තිබුණි.

(ආ) විද්‍යායතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා ආදායම් වියදම් ඇස්තමේන්තු සකස් කර නොතිබීම හේතුවෙන් එක් එක් පාඨමාලාවේ මූල්‍ය ප්‍රගතිය පිළිබඳව පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන රූඩ් 03 පර්චස් 3.9 ක ඉඩම විද්‍යායතනය නමට පවරාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

විද්‍යායතනය දැනට පවත්වනු ලබන පාඨමාලාවන්හි විෂයයන්ට අදාළ නොවන රු.1,447,326ක් වටිනා පොත් 591ක් භාවිතයකින් තොරව විද්‍යායතනයේ පුස්තකාලය තුළ පවතින බව නිරීක්ෂණය විය.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනයේ නව දේශකවරුන් කීප දෙනෙකු වර්ෂය තුළ ඉවත්වීමෙන් පුරප්පාඩු වූ තනතුරු සඳහා නැවත බඳවා ගැනීම ප්‍රමාද වී තිබීම හේතුවෙන් පාඨමාලාවන් දෙකක අධ්‍යයන කටයුතු සම්පූර්ණයෙන් බාහිර දේශකවරුන්ගෙන් ඉටුකරවා ගැනීමට වර්ෂය තුළ රු.585,875ක් වැයකිරීමට සිදුවී තිබුණි.

(ආ) බාහිර දේශකවරුන් 22 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී 21 දෙනෙකු වෙනුවෙන් විද්‍යායතනයේ සේවය කිරීමට අදාළව නිකුත් කළ පත් කිරීමේ ලිපි එම ලිපිගොනුවල නොතිබුණු අතර දේශකවරුන් 16 දෙනෙකුගේ අයදුම්පත් හෝ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතිකපත් ලිපිගොනුවල නොතිබුණි. කෙසේ වුවද පත්කිරීමේ ලිපියක් හෝ නොමැතිව වර්ෂය තුළ බාහිර දේශකවරුන් වෙත රු.1,467,125ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල විද්‍යායතනය පාඨමාලා 09 ක් ආරම්භ කර පවත්වා තිබුණු අතර දිනකට පැය 07ක් වූ අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ එකම දේශකවරයකු විසින් එම පාඨමාලාවට අදාළ සියළුම විෂයයන් ඉගැන්වීමෙහි නිරතව තිබූ බව විගණනයේදී අනාවරණය විය. ඒ අනුව එකම දේශකයකු විසින් පැය 07 ක්ම දේශන පැවැත්වීම අධ්‍යාපන ක්‍රමවේදයන්ට අනුකූල නොවන බවත් ඒ තුළින් ශිෂ්‍යයන්ගේ ඉගෙනීමේ කාර්ය සඳහා ඇති උද්යෝගය අඩුවීමට හේතුවිය හැකි බවත් නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළයුතු වුවත් විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

2015 පෙබරවාරි සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කළ රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පැවරී තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විද්‍යායතනය වෙනුවෙන් වෙනම අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර අරමුණුගත කාර්යක්ෂම කාර්යසාධනයක් ඇතිකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මකව නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන අංශය සතුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීමත්, ප්‍රමාණවත් කාලයක් විද්‍යායතනයේ විගණන කටයුතු වෙනුවෙන් යෙදවිය නොහැකිවීමත් හේතුවෙන් සමස්ත කාර්ය පද්ධතිය පිළිබඳ විගණනයක් සිදු වී නොතිබුණු අතර එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

(ඇ) එසේම විද්‍යායතනයේ මූල්‍ය හා මෙහෙයුම් අංශ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද හඳුන්වා දී නොතිබුණු අතර ගිණුම්කරණ ක්‍රියාවලියද දුර්වල තත්ත්වයක පැවතුණි.

## 5.3 විගණන කමිටු

---------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව විගණන කමිටු පිහිටුවා සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව විද්‍යාතනය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබියදී, සමාලෝචිත වර්ෂය තුළ රු.1,748,555ක් වැය කර භාණ්ඩ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම |
| (ආ) | මුදල් කළමනාකරණය | - | ප්‍රසම්පාදන සැලසුම් හා ඇස්තමේන්තු වලට අනුව වියදම් නොදැරීම |
| (ඇ) | වත්කම් කළමනාකරණය | - | වත්කම් ගිණුම් තැබීම හා ලේඛණ පවත්වා නොගැනීම |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | - | කාර්ය මණ්ඩල බඳවාගැනීම් විධිමත්ව සිදුනොකිරීම හා ලිපිගොනු යාවත්කාලීනව පවත්වා නොගැනීම |
| (ඉ) | පාඨමාලා පැවැත්වීම | - | ඇස්තමේන්තු සකස් නොකිරීම, දේශක පිරිවැටුම අවම කිරීමට කටයුතු නොකිරීම |